## ශ්‍රී ලංකා දුම්රිය සේවය

## **කොළඹ කොටුව/යාපනය/කොළඹ කොටුව සුඛෝපභෝගී සීඝ්‍රගාමී දුම්රියෙහි භෝජනාගාරය බදු ලබාදීම සඳහා ප්‍රසම්පාදන කමිටු ලංසු කැඳවීමයි.**

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් කොළඹ කොටුව/යාපනය/කොළඹ කොටුව සුඛෝපභෝගී සීඝ්‍රගාමී දුම්රියේ ජංගම භෝජනාගාරයේ ආහාරපාන අලෙවි කිරීමේ සේවාව වසර දෙකක කාලයක් බදු පදනම මත පවත්වාගෙන යාම සඳහා තරුපන්තියේ හෝටල් ක්ෂේත්‍රයේ පිළිගත් ආයතන වෙතින් මුද්‍රා තබන ලද ප්‍රසම්පාදන ලංසුපත් කැඳවනු ලැබේ.

**01.සුදුසුකම්**

I. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1963/28 - 2016.04.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය අනුව සංචාරක හෝටල් ලියාපදිංචි කිරීමේ නියෝග යටතේ තරුපන්තියේ හෝටලයක් ලෙස වර්ගීකරණයෙන් ලියාපදිංචිවී මේවන විට වලංගු ලියාපදිංචි සහතිකයක් තිබිය යුතුවීම.

II.භෝජනාගාරය පවත්වාගෙන යනු ලබන ආයතනය විසින් දුම්රියෙහි සියළුම වැසිකිලි හා දුම්රිය ඇතුලත මනා තත්වයෙන් පිරිසිදු කොට පවත්වාගත යුතුය.

**02.ලංසු අයදුම්පත්‍ර ලබාගැනීම**
ප්‍රසම්පාදන ලියවිලි 2023 ජූලි මස 24 වන දින ප.ව.2.00 දක්වා පමනක් නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් අයදුම්පත් කොළඹ 10, දුම්රිය මූලස්ථාන වෙළඳ හා අලෙවි කාර්යාලයෙන් ලබා ගත හැකි අතර, ඒ සඳහා ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ප්‍රධාන මූල්‍ය නිලධාරි වෙත ආපසු ගෙවනු නොලබන ලංසු පෝරම ගාස්තුව ලෙස රු. 2,500/- ක මුදලක් ගෙවා (සතියේ දිනවල පෙ.ව 09.00 සිට ප.ව 03.00 දක්වා පමනක් මුදල් ගෙවිය හැක) ලබා ගන්නා ලද ලදුපත දුම්රිය මූලස්ථානයේ නියෝජ්‍ය අධිකාරී (වෙළඳ හා අලෙවි) වෙත ඉදිරිපත් කළ යුතුය. ලංසු පෝරම ගාස්තුවට අමතරව එම ලේඛණයේ දක්වා ඇති පරිදි ආපසු ගෙවනු ලබන ලංසු බැදුම්කරයක්ද ගෙවිය යුතුය.

**03. ලංසු අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම**
කොළඹ කොටුව/යාපනය/කොළඹ කොටුව සුඛෝපභෝගී සීඝ්‍රගාමී දුම්රියෙහි ජංගම භෝජනාගාරය වෙනුවෙන් ලබාගන්නා ලද අයදුම්පත්‍ර මුල් පිටපත හා අනු පිටපත නිසිපරිදි සම්පූර්ණ කර කවර දෙකක බහා මුද්‍රා තැබිය යුතුය. එම කවරවල මුල් පිටපත හා අනුපිටපත ලෙස පැහැදිලිව සඳහන්කළ යුතුය. එම කවර දෙක තනිකවරයක බහා වම් පස ඉහල කෙළවරේ "කොළඹ කොටුව/යාපනය/කොළඹ කොටුව සීඝ්‍රගාමී දුම්රිය භෝජනාගාර සඳහා ටෙන්ඩර් පත" යනුවෙන් සඳහන් කොට, එම කවරය මුද්‍රා තබා 2023 ජූලි මස 25 වන දින ප.ව 02.00 පෙර ලැබෙන සේ සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ශ්‍රී ලංකා දුම්රිය සේවය, වෙළඳ හා අලෙවි කාර්යාලය, දුම්රිය මූලස්ථානය, ඕල්කට් මාවත, කොළඹ 10. ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ දුම්රිය මූලස්ථාන නියෝජ්‍ය අධිකාරී (වෙළඳ හා අලෙවි) ගේ නිල කාමරයෙහි ටෙන්ඩර්පත් බහාලීම සඳහා සකසා ඇති විශේෂ ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හෝ කටයුතු කළ යුතුය. එම වේලාවෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී ප්‍රමාදවූ හා නැතිවූ අයදුම්පත් පිළිබඳව සලකා බලනු නොලැබේ.

**04. ලංසු භාරගැනීම හා විවෘත කිරීම**
2023 ජූලි මස 25 වන දින ප.ව. 2.00 ට ඉහත 03 ඡේදයේ දක්වා ඇති පරිදි වෙළඳ හා අලෙවි කාර්යාලයේදී අයදුම්පත් විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවට අයදුම්කරුට හෝ ඔහුගේ බලයලත් එක් නියෝජිතයෙකුට හෝ සහභාගී වීමට ඉඩදෙනු ලැබේ.

**05.** බදු කාලසීමාව ඇතුලතදී ජංගම භෝජනාගාරය තුල මෘදු මත්පැන් (බීර) අලෙවි කිරීම සඳහාවූ බලපත්‍ර ලබාගැනීමට අවශ්‍ය එකඟතාවය අදාල රාජ්‍ය ආයතන වෙත ලිඛිතව ලබාදීමට දෙපාර්තමේන්තුව එකඟවේ.

06. ලංසු අයදුම් කිරීමට ප්‍රථම ඉහත සඳහන් අදාල දුම්රිය ජංගම භෝජනාගාරය පරික්ෂා කිරීම සඳහා අයදුම්කරුවන් හට අවස්ථාව ලබා දෙන අතර ඒ සඳහා දුම්රිය මූලස්ථාන වෙළඳ හා අලෙවි කාර්යාලය මගින් අවසර ලබාගතයුතු වේ.

**07.** දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

**08.** ලංසුකරුවන්ට වැඩි විස්තර අවශ්‍ය නම්දුරකථන අංක :-011-2421281 – (දිගු අංකය -8235) ෆැක්ස් :- 011-2431909 හරහා ශ්‍රී ලංකා දුම්රිය සේවයේ වෙළඳ හා අලෙවි කාර්යාලය වෙතින් ලබාගත හැක.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
වෙළඳ හා අලෙවි කාර්යාලය,
දුම්රිය මූලස්ථානය, ඕල්කට් මාවත, කොළඹ 10.